(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 2(4).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2019 මැයි 15 වැනි බදාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 60/'19

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු පියසේන ගමගේ මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු ජේ. සී. අලවතුවල මහතා
ගරු ලකී ජයවර්ධන මහතා
ගරු සන්දිත් සමරසිංහ මහතා
ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා
ගරු විජිත් විජයමුණි සොයිසා මහතා
ගරු මුහම්මදු නසීර් මහතා
ගරු එම්. එස්. තෞෆික් මහතා
ගරු පියංකර ජයරත්න මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— 2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— 2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් 250කට වැඩි පුද්ගලයින්, ජීවිතක්ෂයට පත්වී, පුද්ගලයන්ට හානි සිදු වී, දේපල විනාශ වූ හෙයින් ද;

(අ) එවැනි ප්‍රහාරවලට පෙර ඒ සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත ලැබී තිබුණේද යන්නත්;

(ආ) එවැනි ප්‍රහාර වැළැක්වීමට සහ / හෝ ඒවා අවම කිරීමට අදාළ බලධාරීන් ප්‍රමාණවත් පියවර ගත්තේද යන්නත්;

(ඇ) එවැනි ප්‍රහාරයන්ගේ බලපෑම වැළැක්වීමට සහ / හෝ අවම කිරීමට නොහැකි වීමට හේතුවූ රාජ්‍ය යාන්ත්‍රණයේ අඩුපාඩු තිබුණේද යන්නත්;

(ඈ) එවැනි ත්‍රස්තවාදී ප්‍රහාරවලට දායක වූ වෙනත් කරුණු තිබේද යන්නත්;

(ඉ) අනාගතයේදී එවැනි ප්‍රහාරයන් සිදුවීම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්නත්; සහ

(ඊ) පෙරකී දැට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් කරුණු;

පිළිබඳව සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාව සහ එහි සභාපතිවරයා නම් කරනු ලැබිය යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101හි විධිවිධානයන්ට අනුව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරු දොළොස් (12) දෙනෙකුට වැඩි ගණනකින් සංයුක්ත නොවිය යුතු ය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කරගැනීමටද;

(ආ) පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තන් කැඳවීමට ද, යම් ලේඛන හෝ වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද; එවන් පුද්ගලයෙකුගේ පාලනය යටතේ තිබෙන යම්කිසි පත්‍රිකාවක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සභාපතිවරයා හෝ ඒ වෙනුවෙන් විශේෂයෙන් බලයලත් පුද්ගලයෙක් විසින් සිදුකරන දිවුරුම්දීමක් හෝ ප්‍රතිඥාදීමක් මත සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීම සහ සාක්ෂිකරුවන්ගෙන් වාචික පරීක්ෂණ මඟින් ස්ථිරකර ගැනීමට හෝ නිශ්චය කර ගැනීමටද;

(ඇ) පාර්ලිමේන්තුවෙන් පිටත රටේ ඕනෑම තැනක රැස්වීම් පැවැත්වීමටද;

(ඉ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඊ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත්කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාව තම පළමු රැස්වීම් දිනයේ සිට මාස තුනක් (03) ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් නියම කරන වෙනත් හෝ වැඩිමනත් කාල සීමාවක් තුළ තම වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.